ARIFF SAMSUDEEN
Attorney at Law
Ex. Member of Eastern provincial Council
No.01, New Road, Kalmunai-13

06.09.2024

# මාධ්‍ය වාර්තාව

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙකු ලෙසින්ද, එම පක්ෂයේ ජාතික තරුණ සංවිධායක ලෙසින්ද, තනතුර දැරූ මා එම පක්ෂයේ දැරූ සියළුම තනතුරු වලින් සහ පක්ෂ සමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බවට පක්ෂයේ සභාපතිතුමා වෙතද, ලේකම්තුමා වෙතද, ඊයේ දින (06.09.2004) ලිඛිතව දන්වනු ලැබූ බවට හිතවත් මාධ්‍යවෙදීන් වන ඔබ හමුවේ තබමි.

2015 වර්ෂයේ සිට ආසන්න වශයෙන් වසර 10 ක් පමණ මුස්ලිම් කොංග්‍රසයේ නියෝජිතයෙකු වශයෙන් ක්‍රියා කර ලද මා ගතවූ වසර දෙකක පමණ කාලයක සිට එම පක්ෂයේ කිසිදු රැස්වීමකට සහභාගී නොවුනෙමි. මෙවැනි දේශපාලන වාතාවරණයක් මත මා හිටිහැටියේ කුමක් නිසා එම පක්ෂයෙන් ඉවත්වූයේ ඇයිද යන්න ඔබ සිතනවා ඇත.

මෙම දේශය නිදහස ලබා වසර 75ක කාලයක් ගතවී ඇත. මෙම දශක හත තුල මෙරට පාලනය කරන ලද පාලකයින්ගෙන් මෙරටට සහ ජනතාවට යහපතක් සිදුවී නැත යහපතක් සිදුවී ඇත්තේ කාහටද යන්න මෙරට දනී. මෙම දේශපාලන සංස්කෘතිය වෙනස්විය යුතුය. නමුත්, මෙතෙක් වෙනසක් සිදුවී නැත.

මෙවැනි තත්ත්වයක් යටතේ එළඹෙන 21 වන දින පැවැත්වීමට නියමිත 9 වන ජනාධිපතිවරණය වෙනසක් ඇති කරණු ලබන මැතිවරණයක්විය යුතු බවට මාගේ කැමැත්ත පමණක් නොව නීතිය සහ සාධාරණත්වය, සමනාත්මතාවය, සම අයිතිවාසිකම් අගයන සියළුම දෙනාගේ අපේක්ෂාව වනු ඇත.

එපමණක් නොව දූෂණය,වංචාව, බලය අනිසි ලෙස යොදා ගැනිමකින් තොරව දේශපාලකයින් විසින් පාලනය කරනු ලබන රටක් ලෙසින් ලංකාව පිබිදිය යුතුයි. ඒ සඳහා නව ශක්තියක් අවශ්‍යවනු ඇත. එම ශක්තිය ජාතික ජනබලවේගය සතුව තිබෙන බව මා දකින්නෙමි.

එසේම, ජාතික ජනබලවේගයේ ජනාධිපති අපේක්ෂක අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශ මූලධර්මයන් සහ ඒ සම්බන්ධ ක්‍රියාවලිය මෙරටේ ජනතාව අපෙක්ෂා කරනු ලබන නව දේශපාලන සංස්කෘතියක් ඇති කරනු ඇතැයි යන විශ්වාසය අපට ඇත. එම විශ්වාසය මත සහ කිසිදු වරප්‍රසාදයක් බලාපොරොත්තු නොවී එළඹෙන ජනාධිපතිවරණයේදී ජාතික ජනබලවේගයේ ජනාධිපති අපේක්ෂක අනුර කුමාර දිසානායක මහතාට සහය දැක්විම සඳහා තීරණය කලෙමි.

ආරිප් සම්සුදීන්

නීතිඥ
පෙර සිටි නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී